For private circulation only


# THE WAND

ORGAN OF THE SRI LANKA MAGIC CIRCLE

*The Official Guardian of Magic*

July 2017

## CONGRATULATIONS!



Dr. Kirthi
Best Performer
Rope Magic



Vindya

Best Performer
Silk Magic
&
Card magic



Vihan
Best Performer
Coin Magic

# Mini Contests 2017

**NEXT MEMBERS DAY SUNDAY 30th JULY** ලබන රැස්වීම 30 වන ඉරිදා

Edited by Devsiri Fernando 7 Francisco Place, Moratuwa Tel: 2645927

# World's Highest-Paid Magicians Of 2016: David Copperfield Conjures $64 Million, Tops List

Over the course of David Copperfield's four-decade career, the famed illusionist has walked through the Great Wall of China, levitated over the Grand Canyon and made the Statue of Liberty disappear. His greatest recent feat: pulling $64 million pretax out of his proverbial hat over the past year—and earning the top spot on our resurrected list of the world's highest-paid magicians.

Now in his seventeenth year in Las Vegas, the sixty-year-old performed an astounding 638 shows at the MGM Grand Hotel & Casino in our scoring period. Copperfield also minted millions from corporate gigs as well as exclusive tours and concerts on Musha Cay, one of his 11 private Bahamian islands. In 2013 FORBES estimated his net worth at $800 million, making Copperfield the most commercially successful magician in history.

"It's not just tricks," Copperfield told FORBES in 2013. "Secrets and lots of hard work go into this."



Penn & Teller rank second with earnings of $31.5 million, thanks to their Las Vegas residency at the Rio. In 2015 the duo also worked their magic on Broadway for six weeks. Their CW show Fool Us, hosted by Alyson Hannigan, was recently renewed for a fourth season.

What's the odd couple's secret to success? "We do stuff that matters more to us than anything else in the world," Penn Jillette told FORBES in August. "That's the only magic secret: Being willing to work hard on things people would never believe anyone would work that hard for."

Mindfreak star Criss Angel rounds out the top three. In May Bloomberg put his annual earnings at $70 million, but upon closer inspection, FORBES determined that Angel earned $19 million in our 12-month scoring period. Angel made most of his millions from headlining two Las Vegas shows at the Luxor. Criss Angel Believe closed on April 17 after more than 3,000 performances, and Angel's second show with Cirque du Soleil, Mindfreak LIVE!, opened this past June. The entrepreneurial magician also owns two manufacturing facilities and a television studio in Sin City.

This is the first time FORBES has ranked the world's magic acts in 12 years. Combined, the world's seven highest-paid magic acts earned $157.5 million between June 1, 2015 and June 1, 2016, before management fees and taxes. Figures are based on data from Pollstar Pro as well as interviews with agents, managers and other industry insiders.

The demographics of magic's top earners haven't changed much in a dozen years: the majority of names among the lucky seven are white and male. English magician Dynamo (No. 4, $18 million) is multiracial, while The Illusionists (No. 5, $11 million) include a handful of performers who buck the trend, such as Jinger Leigh ("The Conjuress") and Yu Ho-Jin ("The Manipulator").

But overall, the ranks of the highest-paid magic acts reflect the lack of diversity within the magic industry. In 2013 The Atlantic investigated this gender gap and found that industry observers generally estimated that less than 10% of magicians were female.

The top three magic acts are big stars on the Strip, but corporate gigs are a serious moneymaker for many magicians (though decidedly less glamorous). Michael Carbonaro (No. 7, $6 million) is currently on a hot tour and stars in TruTV's The Carbonaro Effect, and still makes nearly half his income from boardroom magic.

One of the world's most famous magicians is missing from the highest-paid ranks: David Blaine, known for burying himself alive for a week, holding his breath for 17 minutes and other death-defying stunts. How did the endurance artist manage to escape our list? During our 12-month scoring period, Blaine cut down on public and private performances in order to develop his upcoming ABC special, David Blaine: Beyond Magic, and another special project.

In an exclusive interview, FORBES has learned that Blaine plans on launching his first worldwide tour in 2017. "David's been working many years on this tour," says Guy Oseary, Blaine's manager. "He's always had a big show in him." Blaine has already turned down on a number of such opportunities.

"He's passed on $100 million deals in Vegas," Oseary says. "But David's very picky on who he associates with. David makes his decisions based on art, not commerce."

Though the modern-day Houdini didn't make our $6 million cutoff this time around, a tour should make it relatively easy for Blaine to summon enough cash to make the list next year.

Courtesy www.forbes.com






Keep the date free

# Your own made-at-home Dengue fighter




***What you need***

An empty plastic 2 liter bottle, 1/4 cup brown sugar, 1-1 1/3 cup hot water and 1 gram of yeast.
Make the bottom of the bottle dark/black as mosquitos are attracted to dark places.
A few pieces of tape placed around the bottle will suffice to keep the edges in place.

with HDN.............History of Magic XIII මයා කලාවේ ඉතිහාසය XIII

# Magic, Animated Pictures and Cinema


## මායා කලාව, චලන රූප සහ සිනමාව



මැජික් ශිල්පීහු සෑම විටම කොටුවෙන් පිටත සිතන තම ප්‍රේක්ෂකයා පුදුමයට සහ විනෝදයට පත්කළ හැකි අලුත් යමක් තම දර්ශනය සඳහා එක්කර ගැනීමට උත්සහ කරන පිරිසකි. සිනමාව වෙනම කලා මාධ්‍යක් සහ කර්මාන්තයක් ලෙස දියුණු වීමට පෙර යම් ස්ථාවරයකට පැමිණීමේ දී මැජික් ශිල්පීන් වෙතින් ලද දායකත්වයන් පිළිබඳ සඳහනකි මේ“

බොහෝ කලකට පෙර සිටම ගෘහ විනෝදාංශයක් ලෙස පැවතුන සෙවනැලි රූප කලාව (Shadowgraph) නව අර්ථකතනයකින් යුතුව තම දර්ශනය සඳහා ඇතුලත් කර ගත් මුල් කාලීන ශිල්පීහු සෙවනැලි රූප කලාව වේදිකාවට හඳුන්වා දුන්හ. වත්මන් Slide Projector යන්ත්‍රයෙහි පූර්වගාමියා වූ, පහන් ආලෝකයෙන් ක්‍රියාත්මක කළ Magic Lantern උපකරණය මැජික් ශිල්පීහු තම දර්ශන තුළට විචිත්‍රත්වය එක් කිරීමට උපයෝගි කර ගත් ක්‍රම වේදයකි“

Ludwig Doebler (1801-1864) ගැන සඳහන් කිරීමේ දී චලන රූප අදහස මුලින්ම ඉදිරිපත් කළ අයෙකු ලෙසට හැඳින්වුයෙමි. භෞතික විද්‍යාඥකු ද වූ Doebler, 'Phantaskop' උපකරණයක් මගින් චලන රූප



පෙන්නුම් කිරීමේ අංගයක් තම දර්ශන වලට ඇතුළත් කර ගත් බවත් එබැවින්ම ඔහු චලන පින්තූර කලාවේ පුරෝගාමියෙකු ('A pioneer of the moving pitchers') ලෙසද හැඳින් වේ.

විදුලිය නම්‍යශීලිව හසුරුවාලීමට හැකිවීමත් සමග ආලෝකය සහ සෙවනැලි ඉතා ප්‍රභල ලෙස මායා දර්ශනය සඳහා යොදාගැනීම ඇරඹුණි. හොල්මන් සහ භූතයන් පිළිබඳව මිනිසුන් තුළ පැවති බිය සහ කුතුහලය ප්‍රයෝජනයට ගත් ශිල්පීහු වේදිකාවේ හෝ ප්‍රේක්ෂකාගාරය තුල හොල්මන් (Ghosts) මවමින් ත්‍රාසය සහ භීතිය ඇතිකරන දර්ශන ඉදිරිපත් කළහ. ප්‍රේක්ෂකයින් සහ වේදිකාව අතර සවිකළ වීදුරු තහඩුවක් මතට හෝ ප්‍රේක්ෂකාගාරය තුල ඇති කළ දුම් වලාවක් මතට ප්‍රතිබිම්භයක් ප්‍රක්ෂේපනය මගින් චලනය වන හොල්මන් හෝ ඇටසැකිලි දර්ශන මැවීම ද ආලෝකයේ තීව්‍ර තාවය අඩු කිරීම මගින් ඒවා අතුරුදහන් කිරීම ද 19 වන සියවස මුලදීම ඉදිරිපත් විය“

Phantasmagoria (අත්භූතරූප දර්ශන) මැජික් වේදිකාව මතට පැමිණියේ එලෙසිනි. Henry Robin (1811-1874) John Henry Pepper (1821-1900), Phantasmagoria (අත්භූතරූප දර්ශන) තම දර්ශනයන්ට එක් කරගත් පුරෝගාමීන් ය. E.G. Robertson පැරිසියේ දී Phantasmagoria දර්ශනය ඉදිරිපත් කර ඇත“

19 සියවස අවසාන දශකය විවිධ රටවල චලන කැමරාව සහ ප්‍රක්ෂේපණ යන්ත්‍රය පිළිබඳව විවිධ අත්හදාබැලීම් සිදු වූ කාලයකි. Edison සහා Dickson ගේ Kinetoscope ක්‍රමවේදය අනුකරණය සහ අත්හදාබැලීම් කටයුතු කළ එංගලන්තයේ Robert William Paul නම් විදුලි තාක්ෂණ විද්‍යාඥයා, පටිගත කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට හැකි චලන රූප උපකරණ නිපදවිය. ඒ පිළිබඳ දැනගත් Devid Devant (1868-1941) එම උපකරණය මිලට ගෙන දියුණු චලන රූප තම දර්ශනය සඳහා එක් කිරීමට උනන්දු විය. Theatrography දර්ශනය නමින් හැඳින් වූ එම මුල්කාලීන සිනමාව 1896 මාර්තු 19 දින Egyptian Hall හි මායා දර්ශනය සමග ඉදිරිපත් කළ බව සඳහන් ය. මුලින්ම කැමරාගත කළ දර්ශන අතර 'Maskelyne Spinning Plates`, ' The Mysterious Rabbit`, ' The Egg Laying Man' යන මැජික් අංග විය. Maskelyne සහ Devant සිනමාවට මැජික් දර්ශන එක්කළ මුල්ම නළුවන් ලෙස සැලකීමේ ද වරදක් නැත“


George Melies

චත්මන් සිනමාවේ පුරෝගාමියෙකු ලෙස අප දන්නා GeorgeMelies නොහොත් Maries George Jean Melies (1861-1938) ප්‍රංශයේ ධනවත් පාවහන් නිෂ්පාදන ව්‍යාපාරිකයෙකුගේ පුත්‍රයෙකි. ලංඩනයේ උගත් ඔහු Egyptian Hall හි Maskelyne & Cooke දර්ශන දැකීමෙන් මැජික් පිළිබඳව විශේෂ ඇල්මක් ඇති වී එය හැදෑරීමට උනන්දු වූ තරුණයෙකි. ප්‍රංශයට පැමිණ තම පියාගේ ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ වූ අතර මැජික් ශිල්පය වැඩි දියුණු කර ගත්තේය. 1888 දී එවකට Robert Houdin Theatre හි අයිතිය තිබූ Houdin ගේ පුත්‍රයාගේ වැන්දඹු බිරිඳ එය විකිණීමට සූදානම් වන බව දැනගෙන එය මිලට ගැනීමට කටයුතු කළේය.





එතැන් පටන් ප්‍රංශ මැජික් මුල් උරුමයේ හිමිකරු වූ Melies පූර්ණ කාලීනව ප්‍රාසංගික වේදිකාව සහ මැජික් කලාව පිළිබඳව යොමුවිය. 1893 දී ආරම්භ කළ ප්‍රංශ මැජික් ශිල්පීන්ගේ සංගමයේ (French Association of Prestidigitators) හි ආරම්භයේ සිටම මුල් පුටුව හෙබවූයේ ද ඔහුය.

Auguste Lumiere සහ Louis Lumiere දෙසොහොයුරන් ප්‍රංශයේ පැරිස් නුවර 1895 දී ඉදිරිපත් කළ මුල්ම සිනමා දර්ශනය නැරඹූ පිරිස අතර George Melies ද විය. එය දුටු විගසම තම ප්‍රසාංගික කටයුතු සඳහා එම මාධ්‍ය යොදා ලොකු හැකියාවක් ඇති බව වටහාගත් Melies එම තාක්ෂණය සහ උපකරණ කට්ටලයක් මිලදී ගැනීමට ඉදිරිපත් විය. Lumiere සොහොයුරන් එය ප්‍රතික්ෂේප කරන ලදි. එයින් පසුබට නොවූ Melies තම හැඳුනුම් කම මත Danid Devant හරහා ලන්ඩනයේ Robert W. Paul වෙතින් සිනමා උපකරණ මිලදී ගෙන මාස කිහිපයක් ඇතුළත තම ශාලාවේ දී චිත්‍රපට දර්ශන ඉදිරිපත් කළේය. නව අත්හදාබැලීම් කරමින් තමාම චිත්‍රපට නිපදවීමට උනන්දු විය. (එම මුල් කාලීන චිත්‍රපට මිනිත්තුවක පමණ කෙටිකාලයකට සීමා වූ ඒවා විය.)


සිනමා කැමරාකරණයේ දී යෙදෙන double exposure, split screen, dissolving images වැනි සුවිශේෂ ක්‍රම මගින් special effects මුලින්ම හඳුන්වා දුන්නේ George Melies බව සඳහන්ය. Melies ගේ 'A trip to the moon' වැනි චිත්‍රපට සිනමා ඉතිහාසයේ සන්ධිස්ථානය ලෙස සැලකේ“


Car Hertz

මැජික් දර්ශනය සඳහා චලන චිත්‍රපට එක්කර ගත් තවත් මුල් කාලීන මැජික් ශිල්පියෙකි. Car Hertz (1895-1924) ඔහු 1896 තම දකුණු අප්‍රිකානු, ආසියානු, ඕස්ට්‍රේලියානු සහ ඈත පෙරදිග සංචාරයේ දී Robert W.Paul වෙතින් ලබා ගත් උපකරණය මගින් 'Theatrography' දර්ශනය ඉදිරිපත් කර ඇත. සාගරයේ යාත්‍රාකරන නෞකාවක් තුළ දී චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළ මුල්ම පුද්ගලයා වීමේ ගෞරවයද Hertz සතුය. ඒ RMSNorman නෞකාව තුළ 1896 මාර්තු 28 වන දිනදිය. බාහිර ලෝකයට අලුත් අත්දැකීමක් වූ චලන චිත්‍රපට මගින් තම දර්ශනයට වැඩි අගයක් එක්කර ගැනීමට මෙම සංචාරයේ දී ඔහු සමත් විය. මෙම චාරිකාවේ දී Carl Hertz ලංකාවේදී ද දර්ශන පවත්වා ඇති අතර සමහර විට ලංකාව තුල චලන චිත්‍රපට ඉදිරිපත් කළ ප්‍රථම පුද්ගලයා ද ඔහු විය හැක“




සිනමාවට අත තැබූ සුවිශේෂ මැජික් ශිල්පියා වනුයේ මායා ඉතිහාසයේ ඉහලින්ම නම කියැවෙන Harry Houdini (1817-1926) ය. සිනමාව දියුණු වෙමින් පැවති සමයේ දී මැජික් ශිල්පියෙකු ලෙස උපරිම තලයට පැමිණ ආර්ථික වශයෙන් ද ඉහළ ම ධනවතෙකු වූ Houdini, 1906 දී පමණ තම මැජික් දර්ශනය සඳහා චිත්‍රපට කර ගත්තේ ය. 1920 දී පමණ තමාගේ චිත්‍රපට නිෂ්පාදන සමාගමක්, චිත්‍රාගාරයක් සහ රසායනාගාරයක් ආරම්භ කර චිත්‍රපට නිෂ්පාදනයට එක් විය. තමාගේම තිර රචනයන්ට අනුව තමාම තම චරිතය රඟපාමින් Houdini මැජික් ක්ෂේත්‍රයේ කළ වීර ක්‍රියා ඇතුලත් සිනමා පට නිපදවිය. 'The Grim Game 1919' , 'The Man from Beyond 1921', 'Terror Island -1920' ආදියද ඔහු රඟපෑ චිත්‍රපටය. සිනමා ක්ෂේත්‍රය තුල ඉදිරියට යා හැකි නව මානයන් හඳුනා ගැනීමට අපොහොසත් වීම නිසා ඔහු එහිදි ආසාර්ථක වූ අතර නැවතත් සුපුරුදු ලෙස මැජික් වේදිකාව වෙතට යොමු විය“




සිනමාව වර්ධනය සඳහා මැජික් ශිල්පීන් වෙතින් යම් ප්‍රචාරයක් සහ දායකත්වයක් ලැබුණ ද මැජික් කලාවේ අවනතියට මූලිකව බලපෑවේ ද සිනමාව බව සඳහන් කිරීම වරදක් නොවේ. එවකට ඉහළ පන්තියට උරුමව තිබූ සම්භාව්‍ය සංගීතය, නාට්‍යය, චිත්‍ර කලාව සහ ඔපෙරා වැනි මාධ්‍ය තුලින් රසාස්වාදය ලැබීමට වත්කමක් සහ අවස්ථාවක් නොතිබූ ජනතාව වෙත විනෝදාස්වාදය සැපයූ ජනප්‍රිය මාධ්‍යය වූයේ මැජික් දර්ශනයයි. විවිධත්වයකින් යුතුවද අඩු මුදලකට විනෝදාස්වාදය සපයන අලුත් මාධ්‍යය වූ චිත්‍රපට ප්‍රචලිත වීමත් සමග ජනතාව ඒ සඳහා යොමු වූ අතර මැජික් කලාවේ ජනප්‍රියත්වය ද අඩු වූ බව අප පිළිගත යුතු සත්‍යයකි.


# FREE FREE FREE



A valuable collection of non-fiction books has been received by the SLMC. They cover many subjects including self-help, management etc etc.

Members attending the monthly meeting on 30th July can take them away ***free of charge.*** Don't miss opportunity.

## Happy Birthday to all members celebrating their birthdays in July



| | | |
|---|---|---|
| July | 1 | Ms.Yogitha Anthony |
| July | 15 | Micheal Fernando |
| July | 21 | Ranjith Silva |
| July | 21 | Vihan Peiris |

# නිකමට පවසන දේ කෙනෙක්ව විනාශ කළ හැක

එක්තරා වයසක මනුස්සයෙක් සිටියා. ඔහු තමන්ගේ අසල්වැසියා හොරෙක් බව කට කතා පැතිරුවා. එම කතා හේතුවෙන් අසල්වැසි තරුණයා ව අත්අඩංගුවට ගෙන නිර්දෝෂී බැවින් පසුව නිදහස් කළා. තමන්ට කළ අපහාසයට මෙම තරුණයා වයසක මනුස්සයා ට විරුද්ධව නඩු පැවරුවා.







උසාවියේදී ඔහු නඩුකාරයාට මෙසේ කිව්වා. "මම කීවේ නිකන් අදහස් විතරයි. කාටවත් හානියක් කරන්න බලාපොරොත්තු වුනේ නෑ"

නඩු තීන්දුව දෙන්න කලින් නඩුකාර තුමා මෙසේ කිව්වා. "ඔබ, එම තරුණයට විරුද්ධව කිව්ව සෑම දෙයක්ම කොළයක ලියන්න. ඉන්පසු ඒවා එක එක වෙන් කරන්න. අද ගෙදර යන ගමන් පාර දිගට ඒවා දමාගෙන යන්න. හෙට උදේට එන්න මම තීන්දුව දෙන්නම්"

නඩුකාරයා පැවසූ ලෙස ඔහු සිදු කළා. පසු දා උදේ පැමිණි පසු නඩුකාර තුමා මෙසේ කිව්වා. "නඩු තීන්දුවට කලින් ඊයේ යන ගමන් ඔබ දමා ගිය කොළ කෑලි සියල්ල එකතු කරන් එන්න"

"අනේ එකනම් කරන්න බෑ. ඒවා දැන් හුළඟට හැම තැනම විසිරිලා. ඒවා එකතු කරන්න ලෙහෙසි නෑ". එය ඇසූ නඩුකාර තුමා මෙසේ කිව්වා. "ඒ වගේ තමයි, ඔබ නිකන් පවසන අදහස් හැම තැනම ගොස් නැවත ගොඩ ගන්න බැරි වන ආකාරයටම කෙනෙක්ගේ ගව්රවය විනාශ වෙන්න පුළුවන්. ඔබට කෙනෙක් ගැන හොඳ කියන්න බැරිනම්, කිසිවක් නොකියා ඉන්න. ඒක වඩා යහපත්"

Courtesy http://www.gags.lk

# Contestants, Judges and Officials



The six contestants (standing at rear from left) Chenul Vihan, Vindya, Dr. Kirthi, Gayan and Bhanuka are seen with (seated from left) Priyantha, SG Ronald, President Rohan, EVP Lalith, HLM Gamage and VP Shelton












VP Shelton VP Suranjith HLM Gamage and EVP Lalith making the presentations



Four beautiful trophies were donated by VP Welfare Asanka adding much colour to the Mini Contests 2017